02. බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, (2021), **ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,** පළමු වෙළුම, 2 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

03. බලදොර ඉන්ද්‍රජෝති හිමි, (2021), **පූජ්‍ය කරගස්වැවේ විමලානන්ද ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,** අංක 2, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

<u>බෝලියද්දේ ධම්මකුසල හිමි</u>

ශාස්ත්‍රීය ලිපි :-

01. ධම්මකුසල හිමි, බෝලියද්දේ, (2021), **'Bilingual Method as an Approach to Second Language Learning in Sri Lanka.'** *ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, පළමු වෙළුම, 1 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.192-208.

<u>තිඹිරිවැව සිරි සුමන හිමි</u>

ශාස්ත්‍රීය ලිපි :-

01. සිරිසුමන හිමි, තිඹිරිවැව සහ ජයසේන ද සිල්වා, නාලක, (2021), **''සිංහල භාෂාවේ පද බෙදීම පිළිබඳ නව සම්මතයක අවශ්‍යතාව පිළිබඳ විමසුමක්.''** *ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, පළමු වෙළුම, 2 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.24-41.

සංස්කරණ :-

01. බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, (2021), **ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,** පළමු වෙළුම, 1 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

02. බලදොර ඉන්දජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, (2021), **ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,** පළමු වෙළුම, 2 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

03. ගල්වැවේ විමලබන්ති හිමි, මිණුවන්ගොඩ ඤාණාවාස හිමි, කරපික්කඩ සෝභිත හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, (2021), **ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය අභිනන්දන ග්‍රන්ථමාලා අංක 01 මහාචාර්ය පූජ්‍ය වරදිවෙල විජයසුමන අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,** ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුර.

<u>කරදගොල්ලේ සෝභිත හිමි</u>

ග්‍රන්ථ :-

01. **සංස්කෘත උපදේශ සාහිත්‍යාගත ගැටුම් නිරාකරණ ප්‍රවේශ** (පඤ්චතන්ත්‍රය සහ හිතෝපදේශය ආශ්‍රයෙනි), සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, (2021).

සංස්කරණ :-

01. Karandagolle Sobhitha Thero, (2021), **Proceeding**, International Conference (Online) BUSl-IOC 2021, Bhiksu University of Sri Lanka, Anuradhapura.

<u>කළුවානේ කුමාරකස්සප හිමි</u>

ශාස්ත්‍රීය ලිපි :-

01. කුමාරකස්සප හිමි, කළුවානේ, (2021), **'සංස්කෘත කෝෂ සහ නිඝණ්ටු සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්.'** *ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, පළමු වෙළුම, 2 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.103-116.

<u>හල්පිටියේ සමිතසිරි හිමි</u>

ශාස්ත්‍රීය ලිපි :-

01. සමිතසිරි හිමි, හල්පිටියේ, (2021), **'පුදපූජා සහ සිරිත් විරිත් පිළිබඳ බෞද්ධ විචාරය.'** *ප්‍රබුද්ධ ශාස්ත්‍රීය සංග්‍රහය (බෞද්ධ පූජා චාරිත්‍ර හා අභිචාර විධි අංකය),* (සංස්:-) ඇහැලේපොල මහින්ද හිමි, පි.139-154.

02. සමිතසිරි හිමි, හල්පිටියේ, (2021), **'බුදුසමය මගින් නිර්දේශිත පැවිද්ද හා බෞද්ධ පැවිද්දෙහි සුවිශේෂත්වය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්.'** *රජරට විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය - 05 (ඉඉ),* (සංස්:-) එම්.කේ.එල්. අයිරාංගනි, පි.119-130.

03. සමිතසිරි හිමි, හල්පිටියේ, (2021), **'සිංහල වාක්කෝෂය පෝෂණයෙහිලා දෙමළ භාෂාවේ බලපෑම.'** *ප්‍රභාෂා - සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, පළමු වෙළුම, 1 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.166-191.

<u>තෙරිපැහැ උපනන්ද හිමි</u>

ග්‍රන්ථ :-

01. **චීන භාෂාධ්‍යයන.** මරදානඃ ගොඩගේ පොත් ප්‍රකාශකයෝ. ISBN: 978-624-00-1432-8, (2021).

ශාස්ත්‍රීය ලිපි :-

01. උපනන්ද හිමි, තෙරිපැහැ, (2019)*, **'චීන භාෂාවෙහි බහු උච්චාරණ අක්ෂර ('多音字'(du8 y%nz*)) පිළිබඳ විමසුමක්.'** *ප්‍රවචන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) පනාමුරේ චන්දිම හිමි සහ ධම්මින්ද හිමි, පළමු කලාපය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.386-409.

02. උපනන්ද හිමි, තෙරිපැහැ, (2021), **'සිංහල භාෂාවේ ද්විරූපතා ලක්ෂණ හා භාෂා සංස්ථිතිය.'** *චන්දෝදය අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) ගාල්ලේ ධම්මින්ද හිමි සහ ධම්මාලෝක හිමි, පි.297-319.

03. උපනන්ද හිමි, තෙරිපැහැ, (2021), **''චීන භාෂාවෙහි "地"(t} b] de) භාවිතාව."** *ප්‍රභාෂා - සහෘදයා විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, පළමු වෙළුම, 1 කලාපය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.154-165.

සම්මන්ත්‍රණ :-

01. උපනන්ද හිමි, තෙරිපැහැ, (2021), **"විදේශ භාෂා ඉගෙනීම, සිව් කුසලතාව සහ සංස්කෘතික නිපුණතාව"** International online conference, Bhiksu University of Sri Lanka, Anuradhapura.

<u>ලලිත් ප්‍රේමකුමාර මහතා</u>

සඟරා :-

01. Premakumara, Lalit, (2021), **'A Contrastive Study of the Word Order at the Phrase Level in English and Sinhala - A Study Based on Communicative Approach.'** *Prabhasa - Peer Reviewed Academic Journal,* (Editor) Baladora Indrajothi Thero and Thimbiriwewa Sirisumana Thero, Volume 01, Issue 01, Department of Languages, Bhiksu University of Sri Lanka, Anuradhapura, p.97-116.

02. Premakumara, Lalit, (2021). **'The Effect of Oral Corrective Feedback (CF) on English Language Learner's Motivation in Communicative Classrooms- A Study Based on Communicative Approach.'** *Prabhasa - Peer Reviewed Academic Journal,* (Editor) Baladora Indrajothi Thero and Thimbiriwewa Sirisumana Thero, Volume 02, Issue 01, Department of Languages, Bhiksu University of Sri Lanka, Anuradhapura, p.156-177.

ප්‍රකාශන මුද්‍රණද්වාරයෙන් 2021 වර්ෂයේදී එළි දැක්වී ඇත.

සනත් පුෂ්පකුමාර මහතා

සඟරා :-

01. Puspakumara, S. (2021), **'Language Learning Strategies, Learner Dynamics and the Role of the Teacher in Second Language Teaching.'** *Prabhasa - Peer Reviewed Academic Journal,* (Editor) Baladora Indrajothi Thero and Thimbiriwewa Sirisumana Thero, Volume 01, Issue 01, Department of Languages, Bhiksu University of Sri Lanka, Anuradhapura, p.117-29.

සම්මන්ත්‍රණ :-

01. Upananda Thero, T, Pushpakumara, S, and Wanniarachchi, S, (2021), **Learning of Foreign Languages, Four Skills and the Cultural Competence,** International Online Conference, Bhiksu University of Sri Lanka, Anuradhapura.

සචින් අනුෂ්ක වන්නිආරච්චි මහතා

ශාස්ත්‍රීය ලිපි :-

01. Wanniarachchi, W.A.S.A, '**Understanding Linguistic Ostracism: A Critical Overview of the Language Policy and Planning in Sri Lanka.'** *Prabhasa - Peer Reviewed Academic Journal,* (Editor) Baladora Indrajothi Thero and Thimbiriwewa Sirisumana Thero, Volume 01, Issue 01, Department of Languages, Bhiksu University of Sri Lanka, Anuradhapura, p.130-141.

පර්යේෂණ පත්‍රිකා :-

01. Wanniarachchi W.A.S.A. and Wanniarachchi W.S.A. (2021), **Understanding Linguistic Discrimination in the Idolatrous Sinhala Buddhist Nationalism,** The 10th International Conference of Oriental Studies: Global and Local Perspectives, Department of Oriental Studies, University of Warsaw, Poland.

02. Wanniarachchi W.A.S.A. (2021), **Abandoning the ESL Learners in Sri Lankan Rural School Context during the Pandemic, Trends in Language Teaching 2022: The Challenge of Change,** Japan Association of Language Teachers (JALT), Okinawa Chapter.

03. Wanniarachchi W.A.S.A. (2021), **A Critical Pedagogy: The Utilization of Political Cartoons as a Means of Educating the ESL Learner of the Language Policy and the Marginalized in Sri Lanka,** 43rd International Conference of the Linguistic Society of India.

04. Wanniarachchi W.A.S.A. (2021), **An Analysis of the Contemporary Locus of the Rural ESL Learner in Sri Lanka,** 15th International conference of English Language Teachers' Association of India.

05. Wanniarachchi W.A.S.A. and Egodage W.A. (2021), **The Status of Agency in Teacher Identity Towards the Deliverance of Effective Language Teaching: A Study Based on ELT in Sri Lankan State Universities- PGIHS Research Congress,** University of Peradeniya.

06. Wanniarachchi W.A.S.A, Egodage W.A. and Mahanthamulla M.G.D.M.C. (2021), **A Shift of 'Compulsion'? Transitioning from Conventional to Innovative Pedagogic Strategies in the E-Learning Platform,** Rajarata University International Symposium on English Language Teaching, and Rajarata University of Sri Lanka.

07. Wanniarachchi W.A.S.A, Egodage W.A. and Wijerathne H.M.S.C, (2021) **The Significance of the Scaffolding of Learner- Learner Interactions in the ESL Classroom,** Vauniya University International Research Symposium, University of Vauniya.

08. Wanniarachchi W.A.S.A, Upananda Thero, T and Pushpakumara, S, (2021), **Learning of Foreign Languages, Four Skills and the Cultural Competence,** International Online Conference, Bhiksu University of Sri Lanka.

ඩී. එම්. රත්නායක මහතා

සඟරා :-

01. Ratnayake, D. M. (2021), **'A Study on Formation of Japanese Verbs.'** *Prabhasa - Peer Reviewed Academic Journal,* (Editor) Baladora Indrajothi Thero and Thimbiriwewa Sirisumana Thero, Volume 01, Issue 01, Department of Languages, Bhiksu University of Sri Lanka, Anuradhapura. p.142-153.

5.1.4 සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය

ගල්වැවේ විමලබන්ති හිමි

ශාස්ත්‍රීය ලිපි :-

01. විමලබන්ති හිමි, ගල්වැවේ. (2021). **—පරිවෙණ සංකල්පයේ කූටප්‍රාප්තිය සනිටුහන් කරන අෂ්ට මූලායතන පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්"** මහාචාර්ය පූජ්‍ය වරදිවෙල විජයසුමන නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය - 1, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.357 - 369.

02. විමලබන්ති හිමි, ගල්වැවේ. (2021). **—මූල බ්‍රාහ්මීය ශිලා ලේඛනවල පෙනෙන පරුමක හා පරුමකලු යන යන වදන් පිළිබඳ විමර්ශනයක්"** සහය මහාචාර්ය පූජ්‍ය කරගස්වැව විමලානන්ද අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය - 2, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.295 - 303.

<u>කරඳගොල්ලේ විජිතතිස්ස හිමි</u>

ශාස්ත්‍රීය ලිපි ඃ-

01. Wijithatissa thero, K. (2021). **Spirituality: Is it Religious or Secular.** 3rd International online Conference proceeding, Buddhist and Pali University of Sri Lanka. p.84-88.

<u>කුඩාවැවේ සෝමානන්ද හිමි</u>

ශාස්ත්‍රීය ලිපි ඃ-

01. සෝමානන්ද හිමි, කුඩාවැවේ. (2021). **"පුරාතන ශ්‍රී ලාංකේය සමාජ ඒකාබද්ධතාව උදෙසා ඓතිහාසික සාධක (අභිලේඛන ඇසුරෙන්)"**, *හයවැනි ජාත්‍යන්තර (මාර්ගඵල) සම්මන්ත්‍රණය,* ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.39-43.

02. සෝමානන්ද හිමි, කුඩාවැවේ. (2021). **—පුරාතන ශ්‍රී ලාංකේය සමාජයෙහි 'කුල' හා 'වර්ණ' යන වචන භාවිතය",** *ප්‍රභාෂා සහෘදය සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* භාෂා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි. 328 - 338.

<u>කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි</u>

01. ස්ත්‍රීවාදයට දාර්ශනික ප්‍රවේශයක්, (2021) සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශ මාසික විවෘත දේශනය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

02. ලෝක දාර්ශනික දිනයෙහි වැදගත්කම, (2021) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ඒකාබද්ධ ලෝක දාර්ශනික දින සැමරුම් වැඩසටහන.

<u>පාහියංගල සුමංගල හිමි</u>

ශාස්ත්‍රීය ලිපි ඃ-

01. සුමංගල හිමි, පාහියංගල (2020)*****, **''ග්‍රාමවාසී සම්ප්‍රදායේ ආරම්භය, විකාශය සහ අනන්‍යතා පිළිබඳ සංක්ෂිප්ත කියවීමක්''**, *ප්‍රවචන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය* - 2020 (සංස්ඃ-) රදාවානේ සිරිසුමංගල හිමි සහ මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි, දෙවන කලාපය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

ආරාධිත දේශන ඃ-

01. 'The Newspaper' සිනමා විචාරය, Zoom තාක්ෂණය ඔස්සේ, 2021-ජුනි-13, බෞද්ධ අධ්‍යයන පීඨ ශිෂ්‍ය සංගමය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

02. 'පිරිවෙන් අධ්‍යාපනයේ සංඝරාජ යති සලකුණ', Zoom තාක්ෂණය ඔස්සේ, 2021-ජුනි-19, ජාතික පිරිවෙන් දින වැඩසටහන, දෙනුවර කලාපය, මහනුවර.

<u>හඳගිරියේ සිරිසුමන හිමි</u>

ශාස්ත්‍රීය ලිපි ඃ-

01. සිරිසුමන හිමි, හඳගිරියේ, (2020)***** **"ඉගැන්වීමේ ක්‍රම"**, *අධ්‍යාපනයේ මූලිකාංග, අධ්‍යාපනවිද්‍යා අධ්‍යයන විමර්ශිත ග්‍රන්ථය,* (සංස්ඃ-) හඳගිරියේ සිරිසුමන හිමි සහ මිනුවන්ගොඩ ඤාණාවාස හිමි, පළමු වෙළුම -II, කලාපය -I, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.75-107.

02. සිරිසුමන හිමි, හඳගිරියේ (2020)* **"අධිප්‍රජානනය"**, *අධ්‍යාපනයේ මූලිකාංග, අධ්‍යාපනවිද්‍යා අධ්‍යයන විමර්ශිත ග්‍රන්ථය,* (සංස්:-) හඳගිරියේ සිරිසුමන හිමි සහ මිනුවන්ගොඩ ඤාණාවාස හිමි, පළමු වෙළුම -II, කලාපය -II, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.181-204.

03. සිරිසුමන හිමි, හඳගිරියේ (2021), **"සිංහල භාෂාව හා සාහිත්‍ය ඉගැන්වීම සඳහා අනාවරණ ඉගෙනුම"**, *ප්‍රභාෂා - සහෘදයා විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, පළමු වෙළුම, 1 කලාපය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.229-245.

04. සිරිසුමන හිමි, හඳගිරියේ (2019)*, **"ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණ හා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්"** *ප්‍රවචන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) පනාමුරේ චන්දිම හිමි සහ ගාල්ලේ ධම්මින්ද හිමි, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, 10 වන කලාපය, 1 වන අංකය, පි. 343-369.

පර්යේෂණ පත්‍රිකා ඃ-

01. පන්තිකාමර ඉගැන්වීමේ ගැටලු අවම කිරීම සඳහා බෞද්ධ අධිප්‍රජානන උපායමාර්ගවල උපයෝගිතාව, ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, 2021, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

සංස්කරණ ඃ-

01. සිරිසුමන හිමි, හඳගිරියේ සහ ඤාණාවාස හිමි, මිනුවන්ගොඩ (2020)*. ***අධ්‍යාපනයේ මූලිකාංග, අධ්‍යාපනවිද්‍යා අධ්‍යයන විමර්ශිත ග්‍රන්ථය,*** පළමු වෙළුම -II කලාපය I හා II, අනුරාධපුර ඃ සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය ප්‍රකාශන.

****ප්‍රකාශන මුද්‍රණද්වාරයෙන් 2021 වර්ෂයේදී එළි දැක්වී ඇත.***

<u>මුවපැටිගේවෙල හේමාලෝක හිමි</u>

ශාස්ත්‍රීය ලිපි ඃ-

01. හේමාලෝක, මුවපැටිගේවෙල. (2021). **'මනෝවාග්විද්‍යාව හැඳින්වීමක්'.** *ප්‍රභාෂා - භාෂා අධ්‍යයනාංශ සහෘද සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්:-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, මංගල කලාපය (1), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. පි.267-277.

02. Hemaloka, Muwapetigewala. (2021). '**The Development of Cognitive Psychology'**, Journal of Professor Ven.Waradiwela Wijayasumana, Felicitation Volume 1, (in press)

03. Hemaloka, Muwapetigewala. (2021). **'Carl Jung's Collective Unconscious Mind and Past Life of Human Being'**, Pravacana Refereed Journal, Vol 12 (1) (in press)

04. Hemaloka, Muwapetigewala. (2021). **'The Role of Personality Attributes in the Development of Drug Addiction',** Contemporary Human Challenges: Buddhist and Multidisciplinary Perspectives, 6th International Conference (1st online conference), Bhiksu University of Sri Lanka, Anuradhapura (in press)

ගෝනලගොඩ නන්ද හිමි

ශාස්ත්‍රීය ලිපි ඃ-

01. නන්ද හිමි, ගෝනලගොඩ. (2021), **'විශ්ලේෂී දර්ශනයෙහි සාකච්ඡා වන ස්වභාවික හා න-ස්වභාවික භාෂා විශ්ලේෂණය පිළිබඳ විමසුමක්,'** *ප්‍රභාෂා, සහෘද සමීක්ෂිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්ඃ-) බලදොර ඉන්ද්‍රජෝති හිමි සහ තිඹිරිවැව සිරිසුමන හිමි, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,අනුරාධපුර. පි. 278-294.

02. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'සාංදෘෂ්ටික වාදය පිළිබඳ හැඳින්වීමක්,** *සමාජීයවිද්‍යා අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය,'* (සංස්ඃ-) පාහියංගල සුමංගල හිමි, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (in press)

03. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **"දඬුවම හා මරණ දඬුවම පිළිබඳ සෙසරේ බැකෑරියානු විශ්ලේෂණය ඇසුරින් කෙරෙන ආචාර විද්‍යාත්මක අධ්‍යයනයක්",** *ප්‍රවචන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය,* (සංස්ඃ-) රදාවානේ සිරිසුමංගල හිමි සහ මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. (in press)

04. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'මුල් බුදුසමයාගත සත්‍ය සංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්,'** *බෞද්ධ ඥානවිභාගය,* මහාචාර්ය කේ. එන්. ජයතිලක අනුස්මරණ ලිපි සරණිය, (සංස්ඃ-) ගෝනලගොඩ නන්ද හිමි සහ නාමලී කුමාරි හඳගම. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, පි.441-452.

05. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'වෛදික යුගයෙන් ප්‍රකට වන මනස පිළිබඳ සංකල්පයෙහි ඇති වාස්තවිකත්වය පිළිබඳ දාර්ශනික අධ්‍යයනයක්'** *Professor Buddhiprabha Pathirana Commemorative Volume,* Department of Psychology University of Peradeniya. p. 501-508

06. නන්ද හිමි, ගෝනලගොඩ,(2021), **"බෞද්ධ දේශපාලන ආචාරධර්ම පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනයක්"**, *මහාචාර්ය වරදිවෙල විජයසුමන නාහිමි උපහාර කලාපය,* (සංස්ඃ-) ගල්වැවේ විමලබන්ති හිමි, මිණුවන්ගොඩ ඤාණාවාස හිමි, කරපික්කඩ සෝභිත හිමි, සහ තිඹිරිවැව සිරිසුමන හිමි, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, පි.162-171.

පර්යේෂණ පත්‍රිකා ඃ-

01. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'ගබ්සාව සම්බන්ධ බෞද්ධ ආකල්පය පිළිබඳ ආචාරවිද්‍යාත්මක අධ්‍යයනයක්'**, INTERNATIONAL BUDDHIST CONFERENCE ON PĀLI AND BUDDHIST STUDIES. EXTENDED ABSTRACT BOOK., Department of Pāli and Buddhist Studies University ofKelaniya,p.4-6.
https://hu.kln.ac.lk/depts/pali/images/Conference2020/BPC1.pdf

02. නන්ද හිමි, ගෝනලගොඩ. **'BUDDHIST ATTITUDE TOWARDS SEXUAL TRANSFORMATION.'** BPU Webinar Series - Religiosity and Secularism in Futuristic Context - Online Conference, p.34-37. http://www.bpu.ac.lk/conferences-symposia/Religiosity-and-Secularism-in-Futuristic-Context-Online-Conference-2021

03. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'ජල දූෂණය අවම කිරීම සඳහා බෞද්ධ ආචාරධර්මීය ප්‍රවේශයක්.'** BUSL-IOC 2021, Bhiksu University of Sri Lanka – Anuradhapura. p.95.

04. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'බෞද්ධ බ්‍රහ්මදණ්ඩන සංකල්පය බටහිර සදාචාර න්‍යායන් සමඟ සමවිසම වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්.'** ICBS Committee 2021, Department of Pali and Buddhist Studies, Faculty of Humanities and Social Sciences -University of Ruhuna. (Already abstract has presented now-in press)

05. නන්ද හිමි, ගෝනලගොඩ. (2021) **'පරිසර දූෂණය අවම කිරීමෙහිලා බෞද්ධ පාරිසරික ආචාරධර්මයන්හි උපයෝගීතාව.'** iCMA 2021. Faculty of Graduate Studies, University of Sri Jayewardenepura - Gangodawila, Nugegoda, Sri Lanka. (Already abstract has presented now-in press)

සංස්කරණ ඃ-

01. ගෝනලගොඩ නන්ද හිමි සහ නාමලී කුමාරි හඳගම (2021), **බෞද්ධ ඥානවිභාගයඃ මහාචාර්ය කේ. එන්. ජයතිලක අනුස්මරණ ලිපි සරණිය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

5.2 අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු.

2021 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර පහත දැක්වේ.

	අධ්‍යයන පාඨමාලා / සම්මන්ත්‍රණ/ වැඩමුළුව	සංඛ්‍යාව
1	උපාධි පාඨමාලා	08
2	පශ්චාත් උපාධි පාඨමාලා	03
3	සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා	11

5.2.1 උපාධි පාඨමාලා

i. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)
ii. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) (බාහිර උපාධි පාඨමාලාව)
iii. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ දර්ශනය
iv. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ ශිෂ්ටාචාරය
v. ශාස්ත්‍රවේදී (ගෞරව) - පාලි
vi. ශාස්ත්‍රවේදී (ගෞරව) - පුරාවිද්‍යාව
vii. ශාස්ත්‍රවේදී (ගෞරව) - සංස්කෘත
viii. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)

5.2.2 පශ්චාත් උපාධි පාඨමාලා

i. දෙඅවුරුදු ශාස්ත්‍රපති (පර්යේෂණ) - MA
ii. දර්ශනපති - MPhil
iii. දර්ශන විශාරද - PhD

5.2.3 සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා

i. ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
ii. දෙමළ භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
iii. ජපන් භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
iv. චීන භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
v. බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව
vi. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව
vii. දෙමළ ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව
viii. ජ්‍යොතිෂ්‍ය උසස් සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව
ix. ඉංග්‍රීසි සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව
x. දෙමළ සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව
xi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර (බාහිර) පාඨමාලාව

6. පුස්තකාලයීය කාර්ය සාධනය

6.1 පුස්තකාලය සතු ග්‍රන්ථ සංචිතය (2021.12.31 දිනට)

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සතු ග්‍රන්ථ සංඛ්‍යාව 62,049 වේ. ඒවා පාඨකයින්ගේ පරිහරණයට පහසුවන සේ පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත.

<u>පුස්තකාලයීය ග්‍රන්ථ වර්ගීකරණය</u> - ඩිවි දශම වර්ගීකරණය 21 (Dewey Decimal Classification - 21)

000 - සාමාන්‍ය කෘති	- General Works
100 - දර්ශනය සහ මනෝවිද්‍යාව	- Philosophy & Psychology
200 - ආගම	- Religion
300 - සමාජ ශාස්ත්‍ර	- Social Sciences
400 - භාෂාව	- Language
500 - ස්වභාව විද්‍යා සහ ගණිතය	- Science
600 - තාක්ෂණ විද්‍යා (ව්‍යවහාර විද්‍යා)	- Technology
700 - කලා ලලිත කලා	- Arts & Recreation
800 - සාහිත්‍යය	- Literature
900 - භූගෝල විද්‍යාව සහ ඉතිහාසය	- History & Geography

6.2 විඥාපන සම්පත් අත්පත් කර ගැනීම - 2021

	වර්ගය	ප්‍රමාණය	වටිනාකම (රු.)
1	මිලදී ගැනීම් - ග්‍රන්ථ	51	35,415.00
2	පරිත්‍යාග - ග්‍රන්ථ	161	85,790.00
3	විශේෂ පරිත්‍යාග	-	
4	පරිත්‍යාග - පුස්තිකා	-	121,205.00
	එකතුව	**212**	

- පොත් බැඳීම් - 68

6.3 පුස්තකාල සාමාජිකත්වය - 2021

කාණ්ඩය	ලියාපදිංචිකළ සාමාජිකයින් සංඛ්‍යාව	සමස්ත සාමාජික සංඛ්‍යාව
අභ්‍යන්තර ශිෂ්‍ය හිමිවරුන්	171	427
අධ්‍යයන කාර්ය මණ්ඩලය	09	63
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	05	104
බාහිර පාඨමාලා සාමාජිකයින්	09	78
එකතුව	**194**	**672**

6.4 පුස්තකාලයෙන් නිකුත් කරන ලද පොත් සංඛ්‍යාව

	2020 වර්ෂය	2021 වර්ෂය
නිකුත් කළ පොත් ප්‍රමාණය	2431	1509

7. මූල්‍ය කාර්ය සාධනය

7.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

රුපියල්

	විෂය	2020	2021
1	පුද්ගල පඩිනඩි	290,256,636	283,124,729
2	දේශීය/විදේශීය ගමන් වියදම්	3,227,216	2,863,864
3	සැපයුම්	6,371,652	5,416,267
4	නඩත්තු	4,033,179	4,518,857
5	ගිවිසුම්ගත සේවා	37,560,537	35,658,851
6	වෙනත්	23,330,262	15,808,942
	එකතුව	**364,779,482**	**347,391,510**

7.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

රුපියල්

	විෂය	2020	2021
1	ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම	7,043,488	7,505,858
2	යන්ත්‍ර මිලදී ගැනීම්	2,211,134	602,239
3	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	205,947,203	107,923,811
4	වෙනත් (ගොඩනැගිලි සහ පුනරුත්ථාපන)	4,726,719	3,758,368
5	පොත් මිලදී ගැනීම	125,165	35,415
6	ඉඩම් හා ඉඩම් සංවර්ධන	-	9,778,668
7	හැකියා වර්ධනය	84,000	305,534
8	පර්යේෂණ වැඩමුළු වියදම්	2,790,910	2,090,107
	එකතුව	**222,928,619**	**132,000,000**

7.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	අරමුදල් සම්පාදන ආයතනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව
1	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීම - ව්‍යාපෘති අදියර I	ශ්‍රී ලංකා රජය	1,300
2	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීම - ව්‍යාපෘති අදියර II	ශ්‍රී ලංකා රජය	900
	එකතුව		**2,200**

7.4 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2020 වියදම	2021 වියදම	2021.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය %
	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීම - ව්‍යාපෘති අදියර I හා II	2,200	1961.11	99.86	2060.97	83.93%

7.5 යටිතල පහසුකම් පිළිබඳ විස්තර

7.5.1 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - මූලධන ව්‍යාපෘති

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	වැඩ අවසන් කිරීමේ දිනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2021 වියදම	2021.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය %
1	විදේශීය ශිෂ්‍ය නේවාසිකාගාරය (කාමර 25)	2020.01.13	88.13	3.20	80.84	100%
2	මහෝපාධ්‍යායය නිලනිවාසය, පීඨාධිපති නේවාසිකාගාරය, අංශාධිපති නේවාසිකාගාරය, පරිපාලන නිලධාරි නේවාසිකාගාරය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය නේවාසිකාගාරය	2021.03.08	192.76	13.27	175.64	100%
3	තිසාවැව වත්ත ඉඩමේ මළ අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ පද්ධති ඉදිකිරීම	2020.01.14	19.36	0.82	18.09	100%
4	බහුකාර්ය ගොඩනැගිල්ල	2022.06.28 *දිර්ඝ කළ	415.16	82.57	177.35	35.73%
	එකතුව		715.41	99.86	451.92	

7.5.2 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - පුනරුත්ථාපන ව්‍යාපෘති

	විෂය	2020 වියදම (රු)	2021 වියදම (රු)
1	පුනරුත්ථාපන ව්‍යාපෘති	2,586,259.63	28,416,731.43
2	උපදේශන සේවා ගාස්තු	-	-
3	රැඳවුම් මුදල් නිදහස් කිරීම	1,086,784.26	117,759.04
4	තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා ගෙවීම	89,000.00	49,000.00

7.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

රුපියල්

	විෂය	2020			2021		
		ලැබීම්	වියදම	අතිරික්තය/ ඌනතාව	ලැබීම්	වියදම	අතිරික්තය/ ඌනතාව
1	ව්‍යාපෘති නොවන පුනරුත්ථාපන	346,900,000	364,779,482	17,879,482	341,400,000	347,391,510	-5,991,510
2	ව්‍යාපෘති නොවන මූලධන	18,645,514	16,981,416	1,664,098	6,154,000	6,154,009	-9
3	ව්‍යාපෘති - දේශීය අරමුදල්	164,854,486	205,947,203	41,092,717	125,846,000	125,846,000	0

7.7 මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2021

රුපියල්

	විෂය	2020	2021
1	ඒක ශිෂ්‍ය පිරිවැය - පුනරුත්ථාපන වියදම අනුව	777,781	750,306
2	ඒක ශිෂ්‍ය පිරිවැය - මූලධන වියදම අනුව	475,328	285,097
	එකතුව	**1,253,109**	**1,035,403**

8.1 තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව.

පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම බෞද්ධ දර්ශනයේ මූලික පරමාර්ථයකි. ඒ අනුව මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථය බෞද්ධ දර්ශනය හා ඒ හා ආනුෂංගික ක්‍රියාකාරකම් සමග සෘජුවම බැඳී ඇති බැවින් විශ්වවිද්‍යාලය විසින් සිදුකරනු ලබන සෑම ක්‍රියාකාරකමක් ම පරිසරය ආරක්ෂා කරමින් තිරසර සංවර්ධනයක් කරා ගමන් කිරීමට පහසුවන සේ සකස් කර ඇත.

තිරසර සංවර්ධනය මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

1. 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද සූර්ය බල විදුලි පද්ධතිය (100KW) හා සූර්ය බල වීදී පහන් කණු පද්ධතිය (පහන් 70ක් සහිත) මගින් මේ වන විට විශ්වවිද්‍යාලයේ මාසික විදුලි අවශ්‍යතාවයෙන් 30% ආසන්න ප්‍රතිශතයක් සපුරා ගනු ලැබේ. ලැබෙන ප්‍රසම්පාදන ප්‍රතිපාදන මත මෙය ඉදිරියේ දී 100% දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.
2. විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් ප්‍රදේශයේ පාරිසරික සාධකයන්ට ඔරොත්තු දෙන ඖෂධ වර්ග, පළතුරු හා වෙනත් දුර්ලභ ශාඛ රෝපණය කොට පවත්වාගෙන යාමේ ව්‍යාපෘතියක් වාර්ෂිකව සිදුකරමින් පවති.
3. විශ්වවිද්‍යාලය විසින් දෛනිකව බැහැරකරනු ලබන දිරාපත්වන කසළ භාවිතයෙන් කාබනික පොහොර (කොම්පෝස්ට්) නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.
4. පරිසර හානිය වලක්වා ගැනීම පිණිස විශ්වවිද්‍යාලයෙන් වාර්ෂිකව ඉවත්කරනු ලබන පුවත්පත්, සඟරා, ලිපිද්‍රව්‍ය ආදිය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කෙරේ.
5. විශ්වවිද්‍යාලයේ මානමුනාවත්ත පරිශ්‍රයේ හා තිසාවැවවත්ත පරිශ්‍රයේ මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධති දෙකක් සවිකර එමගින් පිටවන ජලය විශ්වවිද්‍යාලයේ පරිසර සංවර්ධනය සඳහා යොදනු ලැබේ.
6. විශ්වවිද්‍යාලය මගින් වාර්ෂිකව බැහැර කරනු ලබන අබලි භාණ්ඩ රජයේ වෙනත් ආයතනවල නැවත ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කරනු ලැබේ.
7. විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි නිසි ක්‍රමවේද සකස් කරමින් පවතී. ඒ යටතේ දැනටමත් විශ්වවිද්‍යාලය තුළ හරිත සංකල්පය ක්‍රියාත්මක කෙරේ.
8. කඩදාසි භාවිතය අවම කිරීම සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් අන්තර්ජාල සන්නිවේදන ක්‍රම වැඩි වශයෙන් භාවිත කරනු ලැබේ.

2021 විගණකාධිපති වාර්තාව හා පිළිතුරු

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අනුරාධපුර

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ANP/E/BUSL/21/AQ-13

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 අගෝස්තු 10 දින.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
විගණන අංශය
31 AUG 2022
පුත්තලම පාර.
අනුරාධපුර.

31 AUG 2022

06

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
විගණන අංශය
26 AUG 2022
අනුරාධපුරය
ශ්‍රී ලංකාව

මහෝපාධ්‍යායන් වහන්සේ,

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,

අනුරාධපුර.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්:- 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
විගණන අංශය
31 AUG 2022
පුත්තලම පාර.
අනුරාධපුර.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ANP/E/BUSL/21/AQ-13 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 අගෝස්තු 10 දින.

මහෝපාධ්‍යයන් වහන්සේ,

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,

අනුරාධපුර.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රීලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍යක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

065

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 ඡේදය ප්‍රකාරව, මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස හෙළිදරව් කළ යුතු මාස 03 කින් කල් පිරෙන ස්ථාවර තැන්පතු රු.13,806,343 ක්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ හෙළිදරව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.92,177,529 ක වත්කම් විෂයයන් 08 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දින වන විට අනාගත ගෙවීමේ බැඳීමක් නොතිබුණු විශේෂ අරමුදල් රු.313,806,708 ක් හා පරිත්‍යාග රු.17,030,262 ක් පොදු අරමුදලට බැර කරනු වෙනුවට එදිනට ජංගම නොවන වගකීම් ලෙස හෙළිදරව් කර තිබුණි.

(ඈ) 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව නිල නිවාස හිමිකම සහිත නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක් අයකළ යුතු නමුත්, භික්ෂු විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ලේඛකාධිකාරී යන තනතුරු සඳහා වෙන්කර තිබුණු නිල නිවාසවල පදිංචිය වෙනුවෙන් අයකළ යුතු රු.310,788 ක් අයකර නොතිබීම හා ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.

(ඉ) වර්ෂ ගණනාවක සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පුස්තකාල පොත් 1,977 ක අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍යප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන භික්ෂු විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විටකියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අතුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

063

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තක්ත්වාගණය කළ මතය සඳහා පදනම කොටසෙහි විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධයම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	නිරීක්ෂණ
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) හා 38 (2) වගන්ති	එක් එක් අස්ථිත්වයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර එහි ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(3)	2014 වර්ෂයේ සිට පැවත එන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු රු.5,053,125 ක් වූ කොන්ත්‍රාත් රැඳවුම් මුදල ආදායකයා විමසා ප්‍රතිචාර නොමැති නම් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIXවැනි පරිච්ඡේදය	
(i) 5.2.1 ඡේදය	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ භික්ෂූන් වහන්සේලා 39 දෙනෙකු සඳහා නිවාස පහසුකම් ලබාදීම වෙනුවෙන් වැටුපෙන් සියයට 7.5 ක මාසික නිවාස කුලියක් අය කළ යුතු වුවද, එක් අයකුගෙන් මාසිකව රු.500 ක කුලියක් පමණක් අයකර තිබුණි. අඩුවෙන් අයකර තිබුණු නිවාස කුලී රු.2,354,348 ක් විය.

061

	(ii) 5.8 ඡේදය	විශ්වවිද්‍යාලයේ නිලධාරීන් වෙත නිවාස පහසුකම් ලබාදී තිබුණු නිවාස 06 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී විදුලිය, ජලය, දුරකථන ගාස්තු ලෙස එකතුව රු.1,544,243 ක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ----------	
	(i) 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී මාස 02 ත් මාස 06 ත් අතර කාල පමාව පිළිබඳ අවධානය යොමු නොකර 2020/2021 අධ්‍යන වර්ෂයේ උපාධි හා විස්තාරික පාඨමාලා 06 ක පිළිතුරුපත් ඇගයීම වෙනුවෙන් රු.3,265,435 ක සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.
	(ii) 2016 මාර්තු මස 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛයේ 4.2 ඡේදය	පශ්චාත් උපාධි බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය මඟින් පවත්වාගෙන යනු ලබන බාහිර උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා 06 ක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඉ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී තිබුණු රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ මහ පෙන්වීමෙහි 6.5.1 ඡේදය.	මුදල් වර්ෂය අවසානවී දින 60 ක් ඇතුළත ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන මාස 03 ක කාල ප්‍රමාදයකින් පසුව 2022 ජූනි 03 දින ඉදිරිපත් කර තිබුණි.
(ඊ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 4 (ii) ඡේදය	පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ එම යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂයේ ආරම්භ කර තිබුණු කථිකාචාර්යයවරුන් 05 දෙනෙකුගේ පර්යේෂණයන්හි ප්‍රගතිය පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 3 (1) වගන්තියෙහි දැක්වෙන බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීමේ පරමාර්ථයට අනුකූලව පනතේ 3(v) වගන්තියේ දක්වා ඇති බෞද්ධ සංස්කෘතික සහ එහි අගයන්

ප්‍රවර්ධනය කිරීම යන පරමාර්ථය ඉටුකළ යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය විසින් ජෝතිෂ්‍ය උසස් සහතික පත්‍ර පාඨමාලාව පවත්වන බව නිරීක්ෂණය විය.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning)ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පිළියෙල කර තිබුණු ලංසු ලියකියවිලිවලට අනුව ජයග්‍රාහී ලංසුකරු මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු.මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වුවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරා ගෙන තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 8 ක් වූ කොන්ත්‍රාත්තුව, ගිවිසුම් ප්‍රකාරව 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු වුවද 2022 මාර්තු 31 දින වන විටත් රු.මිලියන 4 ක් පමණක් වැයකර තිබුණු අතර පද්ධතිය සම්පූර්ණ කරද නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී මහාචාර්යය ස්වාමීන් වහන්සේ නමක් විසින් සිදුකර තිබුණු පර්යේෂණ 02 කට අදාළව රු.1,797,440 ක දීමනා එම ස්වාමීන් වහන්සේ වෙත නිකුත් කර තිබුණු නමුත්, 2022 මැයි 05 දින විටත් එම පර්යේෂණයන්ට අදාළ අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුළු පිරිවැය රු.80,843,406 ක් වූ 2020 ජනවාරි 14 දින වැඩ නිම කර තිබුණු විදේශ සිසුන් 25 දෙනෙකු සඳහා වූ නේවාසිකාගාරය 2022 මාර්තු 03 දින වන විට වසර 02 කට වඩා වැඩි කාලයක සිට නිෂ්කාර්යයව පැවති අතර එම ගොඩනැඟිල්ලට සවිකර තිබුණු රු.3,411,000 ක විදුලිය හා සවිකිරීම්වල වගකීම් කාලයද භාවිතයට ගැනීමෙන් තොරව අවසන්වී තිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

iii. වාර්ෂික වාර්තාවට අදාළ කාලසීමාව සඳහා ඉදිරිපත් වී ඇති විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කළමනාකාරිත්ව හා එහි පාලක මණ්ඩලය විසින් ගනු ලැබ ඇති සහ ඉදිරියට ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග.

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
1. මූල්‍ය ප්‍රකාශන	1.1. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම	(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 ඡේදය ප්‍රකාරව, මුදල් සහ මුදල් සමාන දෑ ලෙස හෙළිදරව් කළ යුතු මාස 03 කින් කල් පිරෙන ස්ථාවර තැන්පතු රු. 13,806,343 ක් , මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ හෙළිදරව් කර තිබුණි.	2022 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.
		(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු. 92,177,529 ක වත්කම් විෂයයන් 08 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.	2022.09.09 දින පැවති විගණන කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කළ අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී මෙම වසර තුළ එය නිම කර ගත නොහැකි බැවින් අදාළ කාර්යය ඉටු කිරීම සඳහා බාහිර හා/හෝ අභ්‍යන්තර විෂයය ප්‍රවීනයන්ගෙන් යුත් කමිටු මේ සඳහා පත් කර ඇති අතර 2022 වර්ෂයේ අවසාන ගිණුම්වල මෙම ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් කිරීමට සටහන් කර ගෙන ඇත.
		(ඇ) 2021 දෙසැම්බර් 31 දින වන විට අනාගත ගෙවීමේ බැඳීමක් නොතිබුණු විශේෂ අරමුදල් රු. 313,806,708 ක් හා පරිත්‍යාග රු. 17,030,262 ක් පොදු අරමුදලට බැර කරනු වෙනුවට ඒදිනට ජංගම නොවන වගකීම් ලෙස හෙළිදරව් කර තිබුණි.	2022 වර්ෂය තුළ මෙම ගිණුම් ශේෂ අරමුදල් යටතේ දක්වා ඇත. ඒ අනුව ගිණුම්වල ගලපා ඇත.
		(ඈ) 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව නිල නිවාස හිමිකම සහිත නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක් අයකළ යුතු නමුත් , හික්මු විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ලේඛකාධිකාරී යන තනතුරු සඳහා වෙන්කර තිබුණු නිල නිවාසවල පදිංචිය වෙනුවෙන් අයකළ යුතු රු. 310,788 ක් අයකර නොතිබීම හා ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.	නිවාස කුලිය අය කිරීම 09/2019 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුගත වීම අවශ්‍ය නොවන බවත්, විශ්වවිද්‍යාලයක නිවාස කුලිය තීරණය කළ යුත්තේ එම විශ්වවිද්‍යාලයේ නිවාස කමිටුව විසින් බවත්, 2020 දෙසැම්බර් 09 දිනැතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් විසින් නිකුත් කරන ලද ලිපියෙහි දැක්වේ. ඒ අනුව විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන ලද නිවාස කමිටුවේ තීරණය පරිදි මේ සඳහා අදාළ රේටයන් තීරණය කර ඇත. එකී රේටයන් මත නිවාස කුලිය අය කිරීම කළමනාකරණ මණ්ඩලය අනුමත කර ඇත.

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
		(ඉ) වර්ෂ ගණනාවක සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පුස්තකාල පොත් 1,977 ක අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	පොත්වල වටිනාකම ගණනය කර ඇති අතර 2022 වර්ෂයේදී අවසාන ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ඇත.
